# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 968/6 - 1997 මාර්තු 26 වැනි බදාදා - 1997.03.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. - බී. 21/78 IV

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

22 වන වගන්තිය යටතේ නියමය

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය, රිචර්ඩ් පතිරණ වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 22 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන් -

(අ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය 1997 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවමි ;
(ආ) ඒ මණ්ඩපයට 'ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය' යන නාමය හා අභිධානය දෙමි ;
(ඇ) ඒ මණ්ඩපය පිහිටා තිබිය යුතු ප්‍රදේශය වශයෙන් වවුනියා දිස්ත්‍රික්කය නියම කරමි ;
(ඈ) ඒ මණ්ඩපයට ව්‍යාපාර අධ්‍යයන හා ව්‍යවහාරික විද්‍යා යන පීඨ පවරමි ;
(ඉ) මෙහි උපලේඛනයේ 1 වන තීරයේ දක්වා ඇති ඒ මණ්ඩපයේ පීඨ, ඒ උපලේඛනයේ 2 වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු බව නියම කොට දන්වමි.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1997 මාර්තු මස 24 වන දින,
කොළඹ දී ය.

උපලේඛනය

| *1 වන තීරය* | *2 වන තීරය* |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයන පීඨය | : මුදල් සහ ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>ආර්ථික විද්‍යා සහ කළමණාකරන අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | : භෞතික විද්‍යා අධ්‍යයන අංශය<br>ජීව විද්‍යා අධ්‍යයන අංශය |

04-183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1 A — D 043488—900 (97/03)